# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
## තනතුරු පුරප්පාඩු

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රීලාංකික පුරවැසියන් අතුරින් සුදුසුකම්ලත් හා අත්දැකීම් සහිත අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. සහකාර අධ්‍යක්ෂ (නීති) – (MM 1-1) - තනතුරු 01 (කොන්ත්‍රාත් පදනම මත)

**රැකියා විස්තරය :**
මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් නීති උපදෙස් සැපයීම සහ ගිවිසුම්, කොන්ත්‍රාත්, බැඳුම්කර ආදිය සකස් කිරීම. අධිකාරිය වෙනුවෙන් උසාවි, කම්කරු උසාවි , විනිශ්වය සභා සහ අනෙකුත් නීති ආයවීම. ඉඩම් හිමිකම් පරීක්ෂා කිරීම, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සහ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමඟ අවශ්‍ය දෑ පරීක්ෂා කිරීම. අධිකාරියෙහි නීතිමය කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු සහය ලබා දීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති උපාධිය ලබා තිබීම සහ නීතිඥවරයෙකු වීම සමඟ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**මාසික වැටුප :**
රු. 71,730/- (මූලික වැටුප) + රු. 17,800/- (ජීවන වියදම් දීමනාව)

**වයස :**
වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) .

## 2. නීති නිලධාරි - (JM 1-1) - තනතුරු 03 (කොන්ත්‍රාත් පදනම මත)

**රැකියා විස්තරය :**
අධිකාරණ නඩු, කම්කරු විනිශ්වය සභා, කාර්මික අධිකරණ, කම්කරු දෙපාර්තමේන්තු පැමිණිලි විභාග සම්බන්ධ රාජකාරීන්, කොන්ත්‍රාත් සහ අනෙකුත් ගිවිසුම් සකස් කිරීම, විනය කටයුතු ආදි සෑම කාර්යයක් සඳහාම යොමුවීම.

**සුදුසුකම් :**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීති උපාධිය ලබා තිබීම සහ නීතිඥවරයකු වීම

**හා**

නොතාරිස්වරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

**මාසික වැටුප :**
රු.58,615/- (මූලික වැටුප) + රු.17,800/- (ජීවන වියදම් දීමනාව)

**වයස :**
වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) .

**අමතර ප්‍රතිලාභ**

- EPF සහ ETF අරමුදලේ ප්‍රතිලාභ
- වාර්ෂික ලාභය මත දිරි දීමනා ගෙවීම
- ත්‍යාග මුදල්
- ප්‍රවාහන දීමනාව

➢ අයදුම්කරු දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමට බැඳී සිටිය යුතුයි.

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අපේක්ෂකයින් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබා ගත හැකි ඥාති නොවන දෙදෙනකුගේ නම්, තනතුරු හා දුරකතන අංක අයදුම්පත්‍රයට ඇතුලත් කොට තම වෘත්තීය සහ අධ්‍යාපන සහතික සහ සේවා සහතික වල සහතික කරන ලද පිටපත්ද සමඟ 2025.08.25 දින හෝ එදිනට පෙර අයදුම්කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ සඳහන් කර සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී වෙත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙනසේ එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.


සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,**

අංක 12,මැක්සන් ටවර්, ඇල්ෆර්ඩ් හවුස් උද්‍යානය,කොළඹ 03.

දුරකතන අංක - 011-2325364,011-2329295, 011-2390645 -8 ෆැක්ස් - 011 2320758